ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

ගුරු අධ්‍යාපන ශාස්ත්‍රපති උපාධිය I කොටස

අවසාන පරීක්ෂණය 2006

ගුරු අධ්‍යාපනඥයින් සඳහා මනෝ විද්‍යාව - **ESP 1261**

කාලය - පැය තුනයි (03)

---

දිනය : 2006.03.08 වේලාව : පෙ.ව.10.00 සිට ප.ව.01.00 දක්වා

---

ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.

01. i. අධ්‍යාපන විද්‍යා පීඨවල ගුරු සිසුන්ගේ චර්යා අධ්‍යයනය කිරීම සඳහා ගුරු අධ්‍යාපනඥයෙකුට යොදා ගත හැකි ක්‍රම දෙකක් නම් කොට විස්තර කරන්න.

ii. ඔබ සඳහන් කරන ලද ක්‍රම දෙක භාවිතයෙන් අනාවරණය කර ගත හැකි ගුරු සිසුන්ගේ චර්යා ස්වභාවයන් නිදසුන් දක්වමින් පැහැදිලි කරන්න.

iii. ඔබගේ අධ්‍යාපන විද්‍යා පීඨයේ පංතිකාමර තත්ත්වයන්ගෙන් සුවිශේෂ නිදසුන් දක්වමින් ඉහත දක්වන ලද ක්‍රම දෙකෙහි සීමාවන් සාකච්ඡා කරන්න.

02. i. පහත සඳහන් මාතෘකා යටතේ ඉගෙනීම් න්‍යායන් දෙකක සමාන අසමානකම් දක්වන්න.

(අ) පුද්ගලයකු තුළ ඉගෙනීම සිදුවන ආකාරය

(ආ) සිසුන්ගේ පෙළඹීම වැඩි දියුණු කළ හැකි ආකාරය

(ඇ) ඉගෙනීම තහවුරු කළ හැකි ආකාරය

ii. "ගුරු අධ්‍යාපනඥයෙකු තුළ සියළුම ඉගෙනුම් න්‍යායන් පිළිබඳ සමස්ථ අවබෝධයක් තිබිය යුතුය." මෙම අදහස සුදුසු නිදසුන් ඇසුරින් තහවුරු කරන්න.

03. i. ඔබ තෝරාගත් විෂයයකට අදාලව බෲනර් පැහැදිලි කර ඇති ශික්ෂාවක ව්‍යුහයන් වර්ග තුන විස්තර කරන්න.

ii. ඔබ තෝරා ගන්නා ලද විෂයෙහි උපදේශන ක්‍රියාවලිය සංවර්ධනය කෙරෙහි එක් එක් ව්‍යුහය බලපෑ හැකි ආකාරය පරීක්ෂා කරන්න.

iii. අධ්‍යාපිතයන්ට සම්බන්ධ විචල්‍යයන් තුනක් නම් කර ඉගැන්වීම්-ඉගෙනුම් ක්‍රියාවලියට ඒවායින් ඇති බලපෑම පැහැදිලි කරන්න.

04. පහත සඳහන් තුනක් පිළිබඳව කෙටි සටහන් ලියන්න.

i. පුද්ගලයකුගේ නිර්මාපීබව සංවර්ධනය කිරීම සම්බන්ධ ගුරුවරුන්ගේ හා දෙමව්පියන්ගේ භූමිකාව

ii. මනෝවිද්‍යාවේ මතුවී ගෙන එන ක්ෂේත්‍ර

iii. ගිල්ෆර්ඩ් ගේ බුද්ධිය පිලිබඳ න්‍යාය

iv. ජීවිතය පුරා සංවර්ධන එළඹුම

v. කාල් රොජර්ස් පැහැදිලි කළ ආකාරයට වැඩිහිටි අධ්‍යාපිතයන්ගේ චර්යා ලක්ෂණ

05. i. මාස්ලෝගේ න්‍යායට අදාලව පෙළඹීමෙහි පදනම සාකච්ඡා කරන්න.

ii. ගුරු සිසුන්ගේ ස්වයං -පෙළඹුම ගොඩ නැංවීමේදී ඔබ මුහුණ දී ඇති ගැටළු තුනක් සාකච්ඡා කරන්න.

iii. පහත සඳහන් එක් එක් ක්‍රියාමාර්ගය ගුරු සිසුන්ගේ පෙළඹීම වැඩි දියුණු කිරීමට හේතු වන්නේ කෙසේද යයි පැහැදිලි කරන්න.

1. කණ්ඩායම් ව්‍යාපෘති සම්පූර්ණ කිරීම.
2. අත්දැකීම් මත පදනම් වූ ඉගෙනුම.

06. i. යෞවන විය කෙනෙකුගේ ජීවිතයේ වැදගත් කාල පරිච්ඡේදයක් ලෙස සැලකීමට හේතු තුනක් පැහැදිලි කරන්න.

ii. අප සමාජයේ යෞවනවියෙන් වැඩිහිටිවියට සංක්‍රමණය වීම සිදුවන්නේ කෙසේ ද? සුවිශේෂ නිදසුන් දක්වමින් පැහැදිලි කරන්න.

iii. තම ස්ව සංකල්පය වර්ධනය කර ගැනීම සම්බන්ධයෙන් යෞවනයින් මුහුණ දී ඇති ගැටළු තුනක් පැහැදිලි කරන්න.

- හිමිකම ඇව්රිණි. -